සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම**
**ஆண்டிறுதி மதிப்பீடு - 2018**
**Year End Evaluation**

| ශ්‍රේණිය / தரம் / Grade | විෂයය / பாடம் / Subject | පත්‍රය / வினாத்தாள் / Paper | කාලය / காலம் / Time |
|---|---|---|---|
| 6 | සිංහල භාෂාව හා සාහිත්‍යය | I, II | පැය 02යි. |

නම:- .................................................................... විභාග අංකය:- ....................................................

- පළමු කොටසෙහි අංක 1 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. I, II පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.

## I කොටස

- නිවැරදි පිළිතුර තෝරන්න.

01. තනිව හල් කළ නොහැකි ව්‍යංජන අක්ෂර වන්නේ
(1) ළ, ණ (2) ළ, ග (3) ඤ, ජ (4) ඥ, ජ

- 2 හා 3 වාක්‍යවල හිස්තැනට සුදුසු, නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න.

02. ........................................ අනුරාධපුරය බලා ගමන් ගත්හ.
(1) මේගවර්ණයෝ (2) මේඝවර්නයෝ
(3) මේඝවර්ණයෝ (4) මේගවර්නයෝ

03. නිර්මාණාත්මක මෙන් ම ........................................ලිපි, රචනා සඟරාවක පළවිය හැකි ය.
(1) විශ්ලේෂණාත්මක (2) විශ්ලේශනාත්මක
(3) විෂ්ලේෂනාත්මක (4) විස්ලේසනාත්මක

- 4 සිට 6 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති වචනවලට සමානාර්ථය දෙන වචනය තෝරන්න.

04. කඩවත
(1) කඩවුණු (2) මුරපොළ (3) නගරය (4) වෙළෙඳ සැල

05. පුරාවෘත්තය
(1) පූර්ණ වෘත්තය (2) අතීත කතා පුවත (3) පූර පක්ෂය (4) පිරුණු කළය

06. පණිඳා
(1) වඳුරා (2) හස්තියා (3) නාගයා (4) මැඩියා

- 7 සිට 9 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති වචනවලට විරුද්ධාර්ථය දෙන වචනය තෝරන්න.

07. පහළ - (1) පතල (2) අස්ළ (3) ඉහළ (4) වහල
08. දුගඳ - (1) දුහඳ (2) දුලබ (3) සුගඳ (4) සුවඳ
09. උදය - (1) දිවා (2) රාත්‍රී (3) මැදියම් (4) සවස

- 10 සිට 12 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති වචන අතරින් අනුක්ත නාම පදය තෝරන්න.

10. (1) ශිෂ්‍යයා (2) සිසුහු (3) ශිෂ්‍යයන් (4) ශිෂ්‍යයෝ

11. (1) මැඩියා (2) මැඩියන් (3) මැඩියෝ (4) මැඩි
12. (1) රෝගීන් (2) රෝගියා (3) රෝගියෝ (4) රෝගීහු

- ප්‍රථම පුරුෂ බහු වචන පදය තෝරන්න.

13. (1) නුඹලා (2) ඔවුහු (3) නුඹ (4) අපි

- උත්තම පුරුෂ ඒක වචන පදය තෝරන්න.

14. (1) ඔහු (2) නුඹ (3) ළමයා (4) මම

- පහත දී ඇති වාක්‍ය අතුරින් නාම විශේෂණ පදයක් සහිත වාක්‍යය තෝරන්න.

15. (1) දැරිය ගී ගයයි (2) උපාසිකාව බුදුන් වඳියි
(3) අක්කා සුදු මල් කඩයි (4) ශිෂ්‍යයා පාඩම් කරයි.

- 16-17 ප්‍රශ්න සඳහා දී ඇති ප්‍රකාශවලට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

16. තමාට නුපුරුදු දෙයක් හරි හැටි නො විමසා කිරීමට ගොස් අමාරුවේ වැටීම.
(1) අනේ කාලේ වනේ වාසේ (2) ගඟට ඉනි කැපුවා වාගේ
(3) අබරා සිල් ගත්තා වාගේ (4) අන්ධයා ඇතාගේ හැටි කීවා වාගේ

17. අනුන් රවටන්ට ගොස් තමුන් රැවටීම.
(1) ආතාට අටුකොස් දුන්නා වාගේ. (2) ආඬි හත්දෙනාගේ කැඳ හැලිය වාගේ.
(3) ඉබ්බන්ගෙන් පිහාටු ඉල්ලනවා වාගේ. (4) ඇවිලෙන ගින්නට පිදුරු දැම්මා වාගේ.

- 18 සිට 20 දක්වා වාක්‍යවල හිස්තැනට සුදුසු පදය තෝරන්න.

18. රත් පැහැ මාළුවා දියෙන් උඩට විත් නැවත දිය යටට ..............................
(1) ගියෙහු (2) ගියේ ය (3) යති (4) ගියහ

19. කම්හලේ සේවකයෝ වැඩ වර්ජනය ..............................
(1) කළේ ය (2) කළා ය (3) කරයි (4) කළහ

20. නුඹ කලා වැවේ අසිරිය ..............................
(1) දුටුවෙහි (2) දුටුවෙහු (3) දුටුවේ ය (4) දුටුවා ය

(ලකුණු 02 × 20 = 40)

## II කොටස

- 1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වේ. 3, 4, 5, 6, 7 ප්‍රශ්නවලින් තුනක් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

01. පන්ති කාමර ඇගයීම් ප්‍රභේදයක් ලෙස ඔබ සිදු කළ සඟරාවක් නිර්මාණය කිරීම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
(i) පන්තිකාමරයේ දී ඔබ නිර්මාණය කළ සඟරාවට යෙදූ නම කුමක් ද? (ලකුණු 2)
(ii) සඟරාවේ සංස්කාරකට පැවරුණු කාර්යයන් 2ක් ලියන්න. (ලකුණු 2)
(iii) සඟරාවට ඇතුළත් කළ ප්‍රධාන ලිපි හතරක ශීර්ෂ පාඨ සඳහන් කරන්න. (ලකුණු 4)
(iv) සඟරාවට ලිපි සකස් කිරීමෙ දී තොරතුරු ලබා ගැනීම සඳහා ඔබ විසින් භාවිත කළ මූලාශ්‍ර හතරක් නම් කරන්න. (ලකුණු 4)
(v) සඟරාවක් නිර්මාණය කිරීම නිසා ඔබට ලැබෙන ප්‍රයෝජන හතරක් ලියන්න. (ලකුණු 4)
(මුළු ලකුණු 16)

02. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 125 කට නො අඩු වන සේ රචනයක් ලියන්න.

(i) ගොවි දිවිය සුන්දරයි

(ii) මා දුටු විසිතුරු - සැණකෙළියක තතු

(iii) මගේ ළමා විය

(iv) "මානකොළ කඩවතෙහි - හවඩියා හමු වුණෙමි"

(v) මා සිත් ගත් නවකතාවක් (ලකුණු 14)

03. ජාත්‍යන්තර ළමා දිනය නිමිති කරගෙන ඔබ පාසලේ සිදු කරනු ලැබූ වැඩ සටහන (පද්‍ය ගායනා තරග, කථික තරග, ළමා චිත්‍රපට ප්‍රදර්ශන) පිළිබඳව විස්තර සඳහන් කරමින් විදේශයක සිටින ඔබේ මිතුරකුට/මිතුරියකට යවන ලිපිය ලියන්න. (ලකුණු 10)

04. උපකාරක පද ඇසුරින් පහත දී ඇති ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1. දි | 2. | | | 3. | 4. ගු | 5. | | |
| | 6. ස | | | භ | | | | |
| | | | | 7. | | | 8. | |
| | | | | | | | | |
| | | | | 9. ජ | | | | ර |

හරහට

1. රාත්‍රි යන්නට විරුද්ධ පදයි
3. ගෙයක බිත්තියෙන් පිටත තිබෙන්නා වූ වහලයෙන් වැසුණු කොටස
6. කාව්‍යශේඛරයට පාදක වූ ජාතක කථාවේ නම
7. භික්ෂුව යන තේරුම ඇති පදයකි
8. මුහුද යන අරුත් දේ
9. කේ. ජයතිලක සූරීන්ගේ ගුරුතුමා වූයේ මෙතුමාය.

පහළට

2. "මල් රොනට බමරු වඩිනා" පද්‍ය පාඨය අයත්වන පද්‍ය පන්තියේ නම
3. "ජීවිත දානය" යන්නට සමාන පදයකි.
4. වැත්තැවේ හිමි රචනා කළ කෘතියකි.
5. "මුහුණ" යන අරුත දෙන පදයකි.

(ලකුණු 10)

05. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

ආකිමිඩීස්ගේ ශ්‍රේෂ්ඨ භාවය ගැන කිසිවක් නොදැන සිටි හටයා ඔහුට තරමක් ළං වී රජුගේ කැඳවුම් නියෝගය දැන්වී ය. තමාගේ ජ්‍යාමිතික ගැටලුවේ පත්ලට ම ගිලී සිටි ආකිමිඩීස්ට සෙබළාගේ ගෝරනාඩුව පවා නො ඇසිණි. දෙතුන් වරක් කතා කළ ද එය ගණන් නොගත් බව පෙනුණු සෙබළා කෝපයට පත් වී ය. ආකිමිඩීස් ගැන හෝ ඔහුගේ නිර්මාණ ශක්තිය ගැන තේරුම් ගැනීමට තරම් බුද්ධියක් නොතිබුණු මේ සෙබළාට මේ විශිෂ්ට පුද්ගලයාගෙන් ලෝකයට සිදුවිය හැකි අනුපමේය සේවය අවබෝධ නො වී ය. රජු මොහු කැඳවන්නේ ගෞරව දැක්වීමට බවද සෙබළාට සිතාගත නොහැකි විය. යුද්ධ කාර්යය පමණක් දන්නා සෙබළාට ආකිමිඩීස් බිම ඉරි අඳිමින් කවර විගඩමක් කරන්නේ දැයි සිතිණි. ''වහාම රජු ළඟට යා යුතු යැ ''යි තදින් පවසමින් සෙබළා ඉදිරියට පැමිණ ආකිමිඩීස් ඇඳ තිබූ රූ සටහන් මත සිට ගත්තේ ය. තම ගැටලුව විනා අවට ලෝකය පිළිබඳ කිසිදු හැඟීමකින් නොසිටි ආකිමිඩීස් මෙයින් කෝපයට පත් වී සෙබළා තල්ලු කර දැම්මේ ය. රාජ නියෝගයට පිටුපෑම ද තමා තල්ලු කර දැමීම ද යන මේ සිද්ධීන් නිසා කෝපයට පත් සෙබළාගේ අසිපත් පහරින් මේ ශ්‍රේෂ්ඨ විද්‍යාඥයාගේ හිස කඳින් වෙන්විණ.

(i) ආකිමිඩීස්ට සෙබළාගේ ගෝරනාඩුව නො ඇසුණේ ඇයි?
(ii) සෙබළා කෝපයට පත්වූයේ කුමක් නිසා ද?
(iii) සෙබළාට ආකිමිඩීස්ගේ විශිෂ්ටත්වය පිළිබඳ අවබෝධයක් නොවූයේ කවර හෙයින් ද?
(iv) මෙහි සඳහන් වන පරිදි ආකිමිඩීස් කෝපයට පත්වූයේ කුමක් නිසා ද?
(v) අනුපමේය, විද්‍යාඥයා යන යෙදුම්වල අර්ථ පැහැදිලි කරන්න.

(ලකුණු 2 X 5 = 10)

06. පෙළපොතේ පාඩම් ඇසුරින් අසා ඇති පහත සඳහන් පාඨ කවුරුන් විසින් කාහට කියන ලද දැයි සඳහන් කරන්න.

(i) ''විජය තොපට ජයවේවා!''
(ii) ''මම මහනුවර අසල ගම් වැසියෙක්මි''
(iii) ''ඔව්, මට වයස අවුරුදු 8ක් විතර ඇති''
(iv) ''හෝ, නවතිනු, කවරෙක් ද?''
(v) ''බොහොම ඉක්මනට ආවා නේද?''

(ලකුණු 2 X 5 = 10)

07. පහත පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

බොන්නට නාන්නට ඇති මේ ගමෙහි වැවේ
දැන්නම් අඩියකට වැඩියෙන් වතුර නොවේ
දුන්නත් පැහැය කළු නයෙකුගෙ දිරුණ හැවේ
පැන් ටික කුමන රසය ද ගැමියනගෙ දිවේ

අව්වට මැරී කුඩමස්සන් කුණු වෙනවා
දිය කළතමින් කන කොක්වැළ පොර කනවා
අලි බෙටි හරක් බෙටි වතුරට දිය වෙනවා
අලියා වැටුණ වැව මේ වැව් දිය බොනවා
(විමලරත්න කුමාරගම)

(i) ගමේ වැවෙන් මිනිසුන් ලබා ගන්නා ප්‍රයෝජන දෙකක් ලියන්න.
(ii) පළමු පද්‍යයේ ඇතුළත්ව ඇති උපමාව හා උපමේය ලියා දක්වන්න.
(iii) කවියා පවසන පරිදි කුඩ මස්සන් මැරී ඇත්තේ කුමක් නිසා ද?
(iv) වැව් වතුරට මිශ්‍ර වූ අපද්‍රව්‍ය මොනවා ද?
(v) කුඩමස්සන්, කළතනවා යන යෙදුම්වල අර්ථ පැහැදිලි කරන්න.

(ලකුණු 2 X 5 = 10)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

ANSWER

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 6 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිතුරු පත්‍රය | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: |

## I කොටස

| | | | |
|---|---|---|---|
| (1) 2 | (6) 3 | (11) 2 | (16) 3 |
| (2) 3 | (7) 3 | (12) 1 | (17) 2 |
| (3) 1 | (8) 3 | (13) 2 | (18) 2 |
| (4) 2 | (9) 4 | (14) 4 | (19) 4 |
| (5) 2 | (10) 3 | (15) 3 | (20) 1 |

(ලකුණු 02 × 20 = 40)

## II කොටස

01. (1) සුදුසු පිළිතුරු සඳහා ලකුණු පිරිනමන්න. (ලකුණු 16)

02. රචනය - සාරවත් භාවය ලකුණු 05

නිර්මාණශීලී බව ලකුණු 06

ශිල්පීය දක්ෂතා ලකුණු 03

03. ලිපිය - ආකෘතිය ලකුණු 04

අන්තර්ගතය ලකුණු 04

පද්‍ය ගායනා තරග, කථික තරග, ළමා චිත්‍රපට ප්‍රදර්ශන යන මේ කරුණු පිළිබඳව සලකා බලා අන්තර්ගතයට ලකුණු පිරිනමන්න.

ශිල්පීය දක්ෂතා ලකුණු 02

04. ප්‍රහේලිකාව -

නිවැරදි පිළිතුරු එකකට ලකුණු 01 බැගින් ලකුණු පිරිනමන්න.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1. ද | 2. වා | | | 3. අ | 4. ගු | 5. ව | | |
| | 6. ස | ත් | තු | හ | ත් | ත | | |
| | නා | | | 7. ය | ති | | 8. සි | ඳු |
| | ව | | | | ල | | | |
| | න් | | | 9. ජ | ය | සේ | ක | ර |

05. (i) තමාගේ ජ්‍යාමිතික ගැටලුවේ පත්ලටම ගිලී සිටි නිසා/ජ්‍යාමිතික ගැටලුව පිළිබඳව දැඩිව සිතමින් සිටි නිසා

(ii) සෙබළා දෙතුන්වරක් කථා කළ ද ආකිමිඩීස් එය ගණන් නොගත් බව පෙනුණ නිසා.

(iii) සෙබළා යුද්ධ කාර්යය පමණක් දන සිටීම /ගණිත ගැටලු පිළිබඳව කිසිවක් නොදන සිටීම/ ආකිමිඩිස් ගැන හෝ ඔහුගේ නිර්මාණ ශක්තිය ගැන තේරුම් ගැනීමට තරම් බුද්ධියක් නොතිබීම යන කරුණුවලින් කරුණු දෙක ලියා ඇත්නම් ලකුණු 2කි. එකක් නම් ලකුණු 01යි.

(iv) බිම ඇඳ තිබූ ඔහුගේ ගණිතමය රූප සටහන් මත සෙබළා තම දෙපා තබා සිටගත් නිසා

(v) අනුපමේය - උපමා කළ නොහැකි/අසමාන

විද්‍යාඥයා - නූතන විද්‍යාව දන්නා තැනැත්තා/ශාස්ත්‍ර පිළිබඳ නිපුණ තැනැත්තා, එක් කොටසකට ලකුණු1 බැගින් ලකුණු 2ක් හිමි වේ. (ලකුණු 2 × 5 = 10)

06. (i) පුංචි පැළේ ගස වෙනා - විජය නාට්‍යයේ තාපසයා ලෙස රඟපෑ කේ. ජයතිලක මහතා විසින් විජය ඇතුළු පිරිස ලෙස රඟ පෑ නළුවන් වෙතට කළ ප්‍රකාශයකි.

(ii) රාසිං දෙයියන්ට බැණවැදුන මුරකරුවා - වෙස්වලාගත් රජතුමා විසින් කඩවත මුරකරු වෙතට කළ ප්‍රකාශයකි.

(iii) සූරිය උදාවී යළි සැඟවුණාදෝ - අනුර සී පෙරේරා විසින් මෙහෙයුම් නිවේදක වෙත

(iv) සතුරු මිතුරුව - රක්ෂකයා විසින් මේඝවර්ණ ට.

(v) ක්‍රියාපද හා එහි ප්‍රභේද - විමලා විසින් සමරවික්‍රමට

07. (i) වතුර බීමට සහ ස්නානය කිරීමට

(ii) වැවේ වතුර නයෙකුගේ දිරුණ හැවේ කලු පැහැය ගැනීම

(iii) දැඩි අව් රශ්මිය නිසා

(iv) අලි බෙටි, හරක් බෙටි, මැරුණු කුඩ මසුන් වැනි කරුණු 2ක් ප්‍රමාණවත් වේ.

(v) කුඩමසුන් - කුඩා මාළුන්

කළතනවා - කළඹනවා, කළවම්කරනවා, මිශ්‍ර කරනවා